පහන් වැටේ

කපුටු බෝ වන්නම

ජයන්ත නිමල් සිරි

අපුල ගල් වැටියකට පෙම් බැඳ
විසුල දුනුවිලි විසිරි සුව විඳ
වපුල වසුරිස් කපුටු* නැගී දුගඳින් හපුටු
සංසාරෙ ඇයිද මෙතරම් කිළුටු?

නහවා පැන් කල හතක සුව විඳ
නගා සුරතක වැළුම් පුදු ලද
නැගී පන්සල් බිමේ* බෝධි පූජා ලබන
අහා (බෝ රජුනි පිරි පින් කළ

ඇසෙන මහ බෝ වන්නම
සිළි සිළියෙ පත්*සලෙන අන්දම
සොර මුලක* පන්සලක ගිරා පැටවුන් වැටුණ
කතාවක ඇදිහි මගෙ සිත්තම

සෝපාකටත් රහතෙකු වෙන්න
කුල ගොතට ඉත සිහින් බැට දුන්න
සිදුහතුන් බුදු උනේ ඔබ ළඟද? මා ළඟද?
කිසිවෙකුදු ඇත්ද ඒ ගැන දන්න?

ඒසහි තුය්හ පිතා නරසීහෝ

නිරාෂ ගුණාසේකර

දුවවිත් සඳළුතලයෙන් රජසට
පටලැවෙන මුදු ස්වරයෙන්
ඈ ගැයූ පසු
මියුරු ම ගීය...

පිත සිවුරෙන් බබළන
මහා සඟ ගණ පෙරටු කොට
ඇත් ගමනින් වඩින
ගත රන්වනක් ළඟ
නතර විය එඩකුමරු...

සිහ රජකුට උරුම
දේදුනු දෙබැම යට
ගව නෙත දිදිපුනා නෙතට...

මිග රජකුගේ සිරුරෙන් වැසී
අතපසුවූ යමක් තිබුණා
පුංචි මුව පොව්වකුට
පිළිතුරු බඳිනු බැරිවුණ...

හිමිදිරි කුරුලූ හඬකින්
ඇයදි පසු
යන්න පළමුව කිමුල්වත හැර
ඔටුනු ලබනට අවැසි වස්තුව...

සක් චාමර ලකුණු ගහණ
ලොව දිනූ පය පාමුල
දැල්වෙන දසක් දැක
එඩරන්වන් නළල රැළිවී
සැලූනි උණුරොම් දාව...

සත් වසක් තිස්සේ
සැලූ ව රුදු සිඳු පත්ළක
හිටිවන ම දියෙන් මතුවී
පැන බිඳී ගිය බුබුළක
කැටිව තිබුණා
නොපිරවූ එක් අඩුවක්...

හිරියල් පෑ දිව නැවී
මිහිරි ම ගැඹුරු හඬකින්
සෙමෙන් මුමුණා "එන්න මා සමඟ" යි
හැරී බලලා මතු මාල දෙස
කොද දන්ත කැකුලෙන්
ලා සිනා වක් පෑ පසු...

පැටළුණු පුංචි අතගෙන
මහා පුරුෂයකු
නොපෙනී ගියේ කුඩාවට...

තාමත් මම මග බලාන....

ප්‍රසාදිනි වෙත්තසිංහ.
මිල්පාක්.

(1997 ජනවාරි දින 20 දින -12 යාතය යළිත අතුරුදහන් වූ ප්‍රයාන්න වෙන්න සොයුරාගේ උපන්දිනය වෙනුවෙනි)

හතලිස් සත් වසක්
සපිරෙයි මේ වෙසගේ නම වැනි දිනට
තාමත් මට සිහිවෙයි ඒ දින
අද වගෙ හොඳට

දෝත දරා කුළුදුල් ඵල
අදරයේ මිහිර
මා ලැබූ සතුට අපමන පුත
ඔබ පියතුම සමග එදා

දිවි මග රුදුරු විය මට
පියතුම අකලට දිවි හැර ගිය දවස
ඔබ හොඳ රුවලක්ම විය
නොකාවක් නම් අප දිවිය

ගුවනට තිබූ අදල්ම
මට නොදැනුනා නොවේ
නැවියෙකු
වන්හට ගියෙ ඒ නිසාමදෝ පුතේ
දිවි පරදුවට තබා සේවය මුල් තැනට ඔබේ
කැප වූ ඔබ ''සැම දෙන හිතවතා '' වුණේ

යානය සමග ඔබ නොපෙනී ගියත් එදා
'අතුරුදහන් ' වචනය වෙන අරුතක් මට දුන්නා
'කොතැන හෝ ඔබ ඇත' මගෙ සිත මට කිව්වා
යැදුමින් මම දිවි මේ දින තෙක් ගෙව්වා

දාහත් වසක් ගෙවුණා
ඔබ රැව නොදැක- ඔබ හඬ නොඇස
වියපත් මට මේ දුක දැන් වැඩියි පුත
කාලය ගෙවෙයි මා හද ගත ගිලන්කර
එනමුදු දිරිය විඳිනට බැට තරම් හද
අපමණ සවිය,දෙවි රැකවරණ ඇත මම නොමෙද

දෙනැගණියන් සොයුරන් පොඩි බෑනණුවන් තිදෙනා
දෙපසින් සිට මහ සවියක් මට දෙන නිතර
මහ ගෙදර මට තනියක් නැත- ඇත ඔබ සුවද
අදහමි දෙවිදුනි ඔබ මා පුතු
එන පැය හා මොහොත

මේ ආදර අම්මි , ෆ්ලොරන්ස් වෙත්තසිංහ
ඔවකගේ සිහැවිලි දුවකගේ පැන්හිදෙන්

අවුරුද්දත් කෙට්ටු කෙට්ටු

ලක්ෂ්මන් කොඩිතුවක්කු

මැල්දි ගත්තෙම
හන්දියට ගොස්
තුනියට අඹපු අතිරහ දහයකුත්
පොඩියට කපපු මුං කැවුම් දොළහකුත්
ලස්සනට මේසය සරසලා
පොඩි එවුන්ට පෙන්නන්නට
කැවුම් පොඩි හය හතක්
ආස්මී එකම එකක්

ඒ විතරක්ද නෙළුම් මල් කොකිස් හත අටක්
හරි ජයයි අවුරුද්ද
නැකතට ඉතිරුණු කිරි
හඳ පතුලෙ උණුවී
දෝරෙ ගලා දොඩවයි සුභපැතුම්

ඇත්තමයි ඇස් වහක් නැහැ
මේ අවුරුද්දත් හොරාවට අව්වු ගහපු
දාහෙ කොළයක් වගේමයි
අතින් අත යන හැටි
කාටත් නොපෙනී හොරෙන් බයෙන්

දරුවන්ගෙ සීනා හඬ
බිරිඳගේ සුසුම් හඬ
වෙච්ච ණය බර අනාගතයට හොරෙන්
මගේ හිස ඇතුලෙ
හිමාවක් නැතිව පුපුරයි
පට පටස් ගා ගුගුරන රතිඤ්ඤා වැලක් මෙන්

අතේ හැඬෑටම මක් වෙලාද
කොවුල් හඬට
නාහෙන් ඇඬන හැටි
ගයාපන් වේගයෙන් ගියක්
අලුතින් දිලෙන තරුවක් වගේ
අද දවසෙවත් නටන්නට
කැරකී කැරකී ඇඹරී ඇඹරී
කලකට පස්සෙ ආ එරබදු මල් පාට
ඇඟ ඇතුලෙ ලේ බිඳු සතුටෙන් තියන්නට

හරි ජයයි අවුරුද්ද
මීන රාශියෙන් මේෂ රාශියට
අමතක වෙන මතක රැගෙන
කොහොම හරි කමක් නැහැ
අතේ වරෙන් ලබන සැරෙත්

ඥානයට කවුලුවක්

ප්‍රේමවංශ දසනායක
ඇල්ටෝනා, වික්ටෝරියා.

සඳ වැරුණ නිසල රැය
නරු පිරුණ අහස් කුස
වෙත රැඳුන ඔබ දෙනෙත
දුටුවෙහිද නොදුටු ලොව

කල්පයක් පෙර දිනක
නරු හැලූ එළිය පොඳ
නහෝ ගැබ සිසාරා
පැමිණ ඔබ නෙතට අද

එදා අද හෙට ලෙසට
කාල පරිමාණයේ
බහා තිබූ මිනුම් දඬු
සියල්ලක් බිඳ දමා

කුදු මහත් සංකල්ප
ප්‍රශ්නයට යොමු කරන
ඥානයට කවුලුවක්
විවර කර දමා ඇත

මහ පොළොව මත වෙලුන
හිමි වළලූ බිඳ ලමින
අනන්තය වෙත ඇදෙන
අභ්‍යාවකාශයේ

ආලෝක වසර දුර
සකල සක්වල පතළ
අපරිමිත ඉහ ලෝක
හිරු මඩල එකතු කළ

විශ්වයේ කඩ ඉමට
හඹා යන සිත් සතන
පියවි ඇස නොම දකින
යථා තතු නොදකිනුදු

දවස

භාතිෂ අකලංක සිල්වා

අළු සුදු වලා තැන තැන - නිදිගැට කඩන අහසට
උණු උණු ඉමේ ඉර එළි - ඉරි ඉරි අඳින පොළොවට
පටු මග ගෙවා යන එන - නන්නාදුනන දන වෙත
සමුදි නගිමි සිහිනෙන් - කන්තෝරුවේ පොඩි පියගැට

හඳුනන මුහුණු එක දෙක - මුහුණට මුහුණ හමුවන
උදයේ සොඳුරු සුභ ගැන - එකමෙක පැතුම මුමුණන
දිළිසෙයි පැරණි පුටු පෙළ - දොරකඩ අසල සිටගෙන
පසුබා යන්න ඇති ඒ - දුවිලි පිසින ලද ගහනැණිය

හුරු අසුනෙහිම හිඳගමි - පරිඝණකයට ඇඟ බැඳ
සංඛ්‍යා, අකුරු කලතමි - ප්‍රස්තාරයක ගෙළ සිඳ
හිස, අැස රිඳෙන විටෙකදි - පින්තූරයක රැව අැර
ඔබ දෙස බලමි, සැනසෙමි - ඩිජිටල් සිහින දැක දැක

කවියක දෙකක උණුසුම - සිත කිති කවන මොහොතක
කොලයක නොපිට තවරමි - සැප, දුක, කඳුල සහ සෙනෙහස
නොසතුටු විටෙක ගුලිකර - ඉවතට විසිකරන එම කව
හෙට යළි සොයන, වෙහෙසෙන - සොඳුරුම කවිය විය හැක

මුදලට වුවද විනිවිද - දැකුමට නොහැකි දිවි පොත
එක පැහැ පිටුම පෙරළන - අඳ වැහි සිහින දින ඇත
කැන්වස් කඩක සිර වී - බිත්තිය සරසවන බුදු රුව
වෙනදට වඩා වැඩියෙන් - මදහස නගන්නේ එවිටය

මිතුරකු සමග සවසට - පසුකර නැවත පොඩි පියගැට
ගංතීරයක ඇහෙරෙමි - සංගීතයක මුදු සුවයට
පොලිටික්, සිහින, ආලය - අතහැර මිතුර මට කියපන්..
ගතකම බිර විතකින් - ලංවිය හැකිද, නොහැකිද නිවනට

www.boondi.lk

උපන් දිනට ආසිරි.

විමලා ආරියරත්න

උවුරුදු සිරින් නෑවී යන බක්	මාසේ
පහලොස් වන දිනට වසරක් එන	දවසේ
ස්වේතා හංසී දෝණිට මෙම සුභ	දවසේ
සුභ පතමින් ගෙනෙමි ආසිරි මල්	දහසේ
රෝස මලක් මෙනි සියුමැලි මුව	දුවගේ
පාන සිනා මල් කැන් කොඳ කැකුළු	වගේ
ආඩම්බර ලෙසින් හොරහින් බලන	රගේ
සිහිවෙයි ළඳරු විය දියණියගේ	මවගේ
විහඟුන් ගී ගයන කල හිමිදිරි	උදයේ
අසමින් ඔවුන් හා එක්වී	කඩිමුඩියේ
කිචි කිචි නද දෙමින් ගයනා කළ	උදයේ
පිනවයි මව්පියන් පුබුදා	හිමිදිරියේ
සඳ කුමරුන් සැරයි තරු මල්	වියහින්
කිරි පැණි ගෙනත් දී නාවයි රුස්	දහරින්
හිරු කුමරුන් මල් පුබුදා ලහිරු	රැසින්
හිල් වන් ගුවන් ගැබ සරසයි සුදු	වියහින්
රස පල වලින් බර වී තුරු වැල්	හිනැහෙයි
පිවිතුරු රුවැති මල් සුවඳින් දුව	නාවයි
සතර දිගින් මඳනළ විත් පවන්	සලයි
සතර වරම් දෙවිවරු පිහි දියර	ඉසියි
සමනල රෑන් දුව වටකර	පියාසලයි
මී මැසි බමර කුල මුමුනා ආසිරි	පතයි
තුරු මත සියොත් කැල ආසිරි ගීත	ගයයි
මේ හැම ආසිරි දෝණිගේ සුභ දිනය	නිසයි

සම්මා සම්බුද්ධස්ස

අතුල විජේවික්‍රම

නිර්වාණේ බිම පෙන්වා
තණ්හා සමුදුර පරදා
ලෝකයාට යන මග සලසා
ප්‍රඥා ප්‍රදීප දැල්වූ
මෛත්‍රී තථාගතස්ස
සම්මා සම්බුද්ධස්ස
ලෝතලයට කරුණාවී
ඇස් හිස් මස් ලේ දන්දී
පාරමිතා පුරමින් සසරේ
පින්වත් බෝසත් ඉපදී
තුන් ලෝ විශාරදස්ස
සම්මා සම්බුද්ධස්ස

දම් ඇස ඥානය ඇසිවී
ලෝ සතුනගෙ දුක වැටහී
සක්වල සහශ්‍ර කම්පාවී
සම්බුද්ධත්වය ගිම්වී
සද්ධර්මයෙ ස්වාමිස්ස
සම්මා සම්බුද්ධස්ස

ලෝකවිදූ ලොව බිහිවූ
භවයෙන් සමුගත් මුනිදු
දාන ශීල භාවනා පුරාදී
පාද පද්ම වැඳ වැතිරී

සුගතෝ දසබලදස්ස
සම්මා සම්බුද්ධස්ස